පේරාදෙණිය විශ්වවිද්‍යාලය
UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (පැරණි නිර්දේශය) - (නොවැම්බර්/දෙසැම්බර් 2018)
GENERAL DEGREE EXAMINATION IN ARTS (Old Syllabus) – (November /December 2018)

# SINHALA I ( SLG 1 )
( ප්‍රබන්ධ කථා හා නාට්‍ය කලාව )

**කාලය පැය තුනයි (03).**

සෑම කොටසකින්ම **එක්** ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.
මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව (09) නවයකි.

---

## I කොටස

1. "**විරාගය** නවකතාවේ අරවින්ද, තමාගේ ආධ්‍යාත්මයට හා පැවැත්මට ස්වයං පීඩාවක් (Masochism) ලබා දුන් තැනැත්තෙකු දැයි නිදර්ශනාත්මකව පරීක්ෂා කරන්න.

2. "ආධ්‍යාත්මික සාමය වෙනුවට අරවින්ද තුළ පිහිටියේ ආත්ම සන්තාපයකි " පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

3. "වත්මනෙහි සිදුවන සියදිවි නසා ගැනීම් මනෝ විද්‍යාත්මකව අධ්‍යයනයේදී බොවාරි මැතිණියගේ චරිතය මනා මූලාශ්‍රයකි." එමාබොවාරි කෘතිය ඇසුරින් විෂයානුබද්ධව විමසන්න.

## I I කොටස

4. රෝමාන්තිකවාදයෙහි ලක්ෂණයක් වන ශෝකාත්මක භාවය (lamentation), ගුණදාස අමරසේකරගේ **රතු රෝස මල** නිදසුන් කර ගනිමින් විමසන්න.

5. "රෝමාන්තිකවාදයෙන් විග්‍රහ කෙරෙන හැඟුම්බර භාවය (emotionalism), ගුණදාස අමරසේකරගේ **ජීවන සුවඳෙහි** බොහෝ කතාවල සුලබ වේ." විමසන්න.

6. ජපානයේ ශින්තො ආගමෙහි ඉගැන්වෙන වාසනාව හා අවාසනාව සතුටින් භාරගැනීමේ ලක්ෂණ, කබවත යශුනරිගේ කෙටිකතාවල චරිත ඇසුරින් නිදර්ශනාත්මකව සාකච්ඡා කරන්න.

(අනෙක් පිට බලන්න)

## III කොටස

7. "ජනප්‍රිය ජීවිත පිළිබඳ යුරෝපා සමාජවල වූ ප්‍රවණතාව විසින් **සෙල්ලම් ගෙය** නාට්‍යයේ එන චරිතවලට හිමි සාමාන්‍ය ජීවිතය විසිරුවා හරියි." විමසන්න.

8. "ප්‍රකට දේශපාලන චරිත ඇසුරෙහි වූ පෞද්ගලික මිත්‍ර ජාල (personal retinue ) පිළිබඳ, මධ්‍යතන ආසියානු සමාජවල වූ ආදර්ශයක් **මැටි කරත්තයේ** විද්‍යමාන වෙයි " සමාලෝචනය කරන්න.

9. ප්‍රේමය හා වෛරය පිළිබඳ හැඟීම් ප්‍රායෝගික තලයකට නැගුණු අවස්ථාවක් ලෙස **පෙමතො ජායතී සොකො** නාට්‍යය සැලකිය හැකිදැයි සාකච්ඡා කරන්න.

(සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගිනි.)

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

CDCE

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (පැරණි නිර්දේශය) - (නොවැම්බර්/දෙසැම්බර් 2018)
GENERAL DEGREE EXAMINATION IN ARTS (Old Syllabñ) – (December 2017)

# SINHALA II ( SLG 2 )

## ( පැරණි ගද්‍ය සාහිත්‍යය, භාෂාව හා ව්‍යාකරණය)

**කාලය පැය තුනයි (03).**

**පළමුවන** හා **නවවන** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

II, III කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරා ගත යුතු ය. මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව නවයකි (09).
නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.

---

## I කොටස

1. (අ) පහත දැක්වෙන **පාඨ තුන (03)** ලිහිල් බසින් ලියන්න.

(ලකුණු 10+8+7=25)

(ආ) ඉරි ඇඳි පද අතුරින් **පහකට (05)** විවරණ සපයන්න.

(ලකුණු 3×5 = 15)

(i)

එ කල්හි **අනඳ** මහතෙරහු බුදුන් කෙරෙ බලවත් සෙනෙහයෙන්[4] අධිවාසනා නො කටැ හී, ''මෙ ඇත් පළමු මා මරාව''යි බුදුන් සඳහා දිවි පියා බුදුන් පෙරට සිටියො. එ සඳ 'බුද්හු, **අනඳ** පහ වැ යා. මා පෙරට නො සිට''යි වදළො. ''වහන්සෙ, මෙ ඇත්[5] චණ්ඩ යැ, පරුෂ යැ, මිනීමරු යැ, <u>යුගත් ගිනි</u> වැන්නැ පළමු මා මරා පසු[6] තොප වහන්සෙ කරා යෙව''යි කීහු. බුදුන් තුන් යලක් කියතුදු, එසෙ මැ සිටිය හැ. පහ නො වූහු.[7] එ කල්හි බුද්හු <u>ඉදුහ බලයෙන්</u> ඔවුන් <u>පිළිබහා</u> සඟුන් අතුරෙහි සිටුවූහ.[8] <u>එ</u> කෙණෙහි එක් මාගමක් **නලගිරිහි** දැකැ මරණභයභීත[9] වැ පලායන්නී උකුළින්[10] ගත් දරුවකු ඇතු හා බුදුන් හා අතුරෙහි දමා-පියා පලා ගියා. ඇත් ඇය ලුහුබැඳැ-පියා නැවතී දරුවා කරා ගියෙ. දරු මහහඬින්[11] හඬයි. බුදුහු **නලගිරිහි** උදෙසා මෙත් පතුරුවා ඉතා මියුරු බඹගොස්[12] විහිදැ, [13] ''හවත් **නාලාගිරිය**, තා සොළොස් කළක් රා පොවා මත් කරන්නාහු, අනෙකක්හු ගන්නට කළාහු නො වෙති, මා ගන්නට කළහැ.[14] අකාරණයෙ <u>කකුල් කළකුරුවා</u> නො ඇවිදැ[15] මොබ එ''යි වදළහැ.

(**අමාවතුර**: කෝදගොඩ ඤාණාලෝක හිමි සංස: 237පිටුව)

(අනෙක් පිට බලන්න.)

ii.

තව ද මෙම කප සතර වැනි ව බුදු වූ අප මහා ගෞතම නම් බුදුරජාණන් වහන්සේ බුදු වූ නව වැනි මස දුරුතු මැදි පොහෝදිනයෙහි මේ ලඞ්කාද්වීපයට වැඩ මහවැලි ගං අස දිග තුන් යොදනක්[7] හා පුළුල දෙයොදනක්[8] පමණ ඇති මහමෙවුනා උයන්හි කඳවුරු බැඳ ඔවුනොවුන් හා සංග්‍රාමයට පටන්ගත්තාවූ මහා යක් සෙනඟ මැද ආකාශයෙහි වැඩ සිට අහස්[9] පොළෝ ගුගුරුවා යක්‍ෂයන් තැති ගන්වා වැසි පුළං සහිත ඝනාන්ධකාරයක් මවා යක්‍ෂයන් මූර්ඡා කරවා අඳුරු දුරුකොට පුන්සඳක් සේ පෙනී නැවත සියලඟ දුමවා[10] දුම් පළා හැර යක් සෙනග <u>ධූමාන්ධකාරයෙන්</u> හය ගන්වා පෙනී එකල යක්‍ෂයන් විසින් අවකාශ කොට දෙනලද මහියඞ්ගණ චෛත්‍යස්ථානයෙහි සම්කඩ අතුට යක්සෙනඟ මැද වැඩහිඳ <u>සම්කඩ</u> සතරදිගින් ගිනිකඳ සතරක් මවා දසදිග ගිනිකඳු විහිදුවා යක්‍ෂයන් ලුහුබැඳ[11] මුහුදු වෙරළ රැස්කරවා යක්[12] ගිරිදිවයින ගෙන්වා යක්‍ෂයන් එහි පිහිටුවා පෙර තුබූ තන්හි ම ස්ථාවර කොට එකෙණෙහි පූජා භාණ්ඩ ගෙන නොයෙක් දෙසින් අවුත් රැස්ව සිටියා වූ සමන්කුළ වසන මහ සමන්දෙවිඳු හා ලක්දිව ඒ ඒ තන්හි පිහිටි වෘක්‍ෂ පර්වත හැලි දෙළ[13] විල් පොකුණු වැලිතලා <u>ලියමඩුලු</u> ආදියෙහි වසන දෙවදෙව සමූහයාට බණ වදරා <u>නොයෙක්</u> කෙළගණන් දෙවියන් මාර්ගඵලයට පමුණුවා අසඞ්ඛ්‍යයක් දෙනා ශරණ ශීලයෙහි පිහිටුවා එදවස් සෝවාන් වූ සමන්දෙවු රජහට කේශධාතු මිටක් දී ලක්දිව සිසාරා ප්‍රදක්‍ෂිණා කොට නැවත යක්‍ෂාවාස නොවන සේ අරක් දී උරුවෙල් දනවු වැඩිසේක.

(**සද්ධර්මාලංකාරය** : ප්‍රාචීන භාෂොපකාර සමාගම: 372-373 පිටුව )

iii.

''තව ද: ඒ සත්මස මුළුල්ලෙහි ස්වාමිදරුවන් මාගේ නුවරට වන් දවස් පටන් මම ද යානෙක නො සැතපී බිම ම සැතපිණිමි. ස්වාමිදරුවන්ගේ ම අකුසල බෙලෙන් ඒ සා දුකකට පැමිණි බවක් මීස මා විසින් සැබවින් කළා වූ <u>නිස්නෙහයක්</u> නො වන නියාවට දවසින් දවස ගන්නා දුක් බල බලා අනුන්ට නො හඟවා ම මා අතුරෙහි හැඬූ හඬ, එ දවස් මාගේ ගුණ පරික්ෂා කරනු නිසා වසුන් කද කර තබාගෙන හිණිපාමුල <u>හුණු හඬ</u> අසා ළෙහි බඩැ අත් සපමින්, කඳුළු ධාරා වගුරමින් යහන් ගබඩාවෙන් මා දිවූ දවස ම පක්ෂපාත කමට ම දෙස් කියා සිටීම ය. තවද: එ සත් මසෙහි ස්වාමීන් පිසූ බත් මා අනුභව කළැ යි ස්ත්‍රීධර්මය වරදවා පියැ යි සිතත් නමුත් දවසෙක ත් ඔබ පිසූ බත් දිවගත් නො ගැයෙම් ම ය, එ බත් කුදට දී කුදගේ වැටුප් සාලෙන් පිසූ නිවුඩුසාලේ දසි භොජනය ම අනුභව කෙළෙමි, එ කල මා අනුභව කළ භොජනය සිතූ කල කුසරජ්ජුරුවන් අනුභව කළ වසුන් පත්ලෙහි <u>දඹුකඩ භොජනය</u> තවත් රසවත් දෝ හෝ යි සිතමි. එසේ රූමදයෙන් මත් වූයෙමි පවා ස්වාමිදරුවන්ට අනාදරයක් නො කෙළෙමි, ඒ ඒ ජාතියෙහි ම විසින් කළාවූ කිසියම් අපරාධයක් ම නිසා මා පතන්නා වූ ස්වාමිදරුවන්ට මැණියන් වහන්සේට පාවා දුන් රාජ්‍යදනාදියෙන් දන පාරමිතාව සිද්ධ විය.

(**පූජාවලිය**: කිරිඇල්ලේ ඥාණවිමල සංස්: 686 පිටුව )

(අනෙක් පිට බලන්න.)

## II කොටස

2. "දේව ඇදහිලි සහ පූජා කෙරෙහි යොමු වූ බෞද්ධයා බුදුන්වහන්සේ හා බුදු දහම වෙත හරවා ලීම අමාවතුර කතුවරයාගේ අභිප්‍රායක් විය." විමසන්න.

3. ගුරුළුගෝමීන් අමාවතුරේ දී උපයුක්ත රචනෝපක්‍රම පිළිබඳ සනිදර්ශන විග්‍රහයක යෙදෙන්න.

4. "ධර්මෝපදේශ සපයමින් පාඨකයා දනට පිනට යොමු කිරීම පූජාවලී කතුවරයාගේ අරමුණක් විය" මේ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.

5. **සද්ධර්මාලංකාරය** මගින් ප්‍රකට වන සමකාලීන සමාජ, දේශපාලනික හා ඓතිහාසික තොරතුරු පිළිබඳ විවරණයක් කරන්න.

## III කොටස

6. **"දුහුනන් දනුම් සඳහා - කරනෙමි සිදත් සඟරා"** සිඳත් සඟරාව රචනා කිරීමේ පරමාර්ථය වෙත අවධානය යොමු කරමින්, මෙම දුහුනන් කවුරුන්දැයි පහදන්න.

7. "සිඳත් සඟරාවේ ඇත්තේ සන්ධි කිරීම් මිස සන්ධි වීම් නොවේ" මෙම අදහස සනිදර්ශනව පැහැදිලි කරන්න.

8. **"පියවි දෙවැදෑරුම් - ද පිය වි සඳ පියවි වී "** ප්‍රකෘති පිළිබඳ සිදත් සඟරා මතය පැහැදිලි කරන්න.

9. පහත දැක්වෙන වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කර ලියන්න.

i අමරා දේවී මහෞෂධ පඬිතුමන් නොදැක වැලපුණේය.

ii. ජනාධිපති ආණ්ඩුව විසුරුවා හැරිය බව අසා අයෙක් තුටු ගී ගායනා කළ අතර අයෙක් නැටුවේය.

iii. පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය මිත්‍යා වපුරති.

iv. ලේඛකාධිකාරිවරයා කැඳ වූ සාකච්ඡාවට කාර්යාල සේවකයෝ පැමිණියේ නැත.

v. සමරු දේශනය උදෑසන දහයට පවත්වනු ලැබේ.

vi. මන්ත්‍රීවරයා විසින් මැරයන් ලවා මිනිස්සු මරති.

vii. කවුරු නම් අට පාස් මැරයන්ට ඡන්දය දෙයි ද?

viii. මැති ඇමතිවරුන් විසින් රටේ මූලික නීති සිඳ බිඳ දමති.

ix. දේශපාලනඥයා බොරුවෙන්ද, කට්ටයා වංචාවෙන්ද, දුසිල්වතා බොරු ශීලයෙන්ද බඩ වඩා ගනිති.

x. දේශපාලනඥයන් බොරුව, වංචාව , හා ප්‍රෝඩාව කලාත්මකව හසුරුවති.

(2 සිට 9 දක්වා පිළිතුරුවලට උපරිමය ලකුණු 15 බැගිනි.)

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
**UNIVERSITY OF PERADENIYA**

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (පැරණි නිර්දේශය) -(නොවැම්බර්/දෙසැම්බර් 2018)
GENERAL DEGREE EXAMINATION IN ARTS (Old Syllabus) – (November/ December 2018)

## SINHALA III ( SLG 3 )
**(කාව්‍ය විචාරය, පැරණි පද්‍ය සාහිත්‍යය හා සාහිත්‍ය වංශය)**

**කාලය පැය තුනයි (03).**

**පළමු වන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න. II, III කොටස්වලින් එක් ප්‍රශ්නයක් වත් තෝරාගත යුතු ය. නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.

මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව අටකි (08).

---

## I කොටස

1. (අ) i. පහත දැක්වෙන පද්‍ය **ලිහිල් බසින්** ලියන්න.

දිමුතු මුතු විමල් පුලිනතල පත වම්යෝ
කියාලුහු කිරණවූයේ පබළ ලියපෙළ රඳනා

බසුත් සැදි පියන් පනතෙතර දිය තෙරහිම්
පබවත කත සමාමෙන් තුටිනුතුළෙව් යෙහෙළි විල්

පබවත ගලත ගලත සොම් වුවනත දිස්නා
මිණිමුතු පියුම්සිරි හා වෙනසක් නොදත් බිඟු රජ

පහළ පියවුරුනී සසල විල සිලිල්හි බිජු
වැළහි සපුසල් සේ නා බිය දනවී පුරපියන්

පියවුරු (නි) තො උකහා පිහිනත උඩුමුව වුවන්
කලක් පියුමැයි බිඟුනෙත් කිම්දූ ගන ගැබැ විදු පෑ

(**කව්සිළුමිණ**: ඇම්. බී. ආරියපාල සංස්: 506-510 ගී)

ii. **කව්සිළුමිණ** කවියා විසින් මවනු ලබන කාව්‍යමය සංකල්පනා අදාළ අවස්ථාව රසවත් කිරීම පිණිස බලපාන ආකාරය කෙබඳුදැයි විමසන්න.

(අනෙක් පිට බලන්න)

(ආ) i. පහත දැක්වෙන පද්‍යවල අර්ථ **ලිහිල් බසින්** ලියන්න.

ළ ඳු න් කැකුළු තන පට බැම්මකින්යු තේ
එ ව න් දගේ සිට දුටුවන්ද බැඳ ල තේ
මෙ යි න් මිදී මුන් පැලඹුම් ලැබුව හො තේ
සෙ දි න් මෙමුළු ලොව වුව බැඳ ලතී සි තේ

සි සී වතට කව කිවි දන කියති සි සී
නො සී කරනු ඉන් නිලුපුල නෙතට නි සී
ලැ සී ගමන් වෙත හස ගමන පසු බ සී
ප සී පසින් වැඩි සැර යුති ලියෝ නි සී

(**මයූර සන්දේශය**: ඩබ්. එෆ්. ගුණවර්ධන සංස්කරණය: 117-118 පද්‍ය)

ii. කාන්තා වර්ණනයේදී මයූර සන්දේශ කවියා දක්වන කුසලතාව සාකච්ඡා කරන්න.

(ඇ) i. පහත සඳහන් පද්‍යවල අර්ථ **ලිහිල් බසින්** ලියන්න.

මුනි ගුණ දස දිග වීදේ
තුටු වූ සත සිත පැදේ
නොඅසන ලෙස අපවාදේ
කෙරෙති පසඟතුරු නාදේ

අප මුනිඳුන් ගේ අපමණ
ගුණ දැන ගෙන රැගෙන සරණ
බව දුක් වේ වයි නිසරණ
දමති අයෙක් පළන් බරණ

ලොලා වඩන සිත ළඳරු ව
ප ලා නොයන ලෙස සොඳුරු ව
ක ලා සපිරි සඳ අයුරු ව
බ ලා ගෙන ම යෙති මුනිරු ව

මුනි යන මඟ ගෙන පිරිබඩ
ගෙන දරුවන් ගෙන් පිරි බඩ
සල්පිල් වෙත සිට අග බඩ
වඳිති ලියෝ සිට මඟ බඩ

වෙ නි න් වෙන ම පිපි මල් සිඳ
රොනින් රොන ම ගෙනවුත් සොඳ
තැනින් තැන ම අඟනෝ ළඳ
වෙනින් වෙනම කළෝ ය පුද

(**බුදුගුණ අලංකාරය**: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තු සංස්කරණය: 493-497 පද්‍ය)

(අනෙක් පිට බලන්න.)

(ඇ) iii ස්වභාවොක්තිය මගින් යම් අවස්ථාවක් නිරූපණය කිරීම සඳහා බුදු ගුණාලංකාර කවියා දක්වන සාමර්ථ්‍යය කෙබඳු ද?

(පළමු වන ප්‍රශ්නයට උපරිමය ලකුණු 40යි)

## II කොටස

2. "සිංහල පද්‍යයේ ආරම්භක අවධියෙහි හමුවන කාව්‍ය කෘති මගින් හෙළි වන්නේ, තත් කවීන් **සියබස්ලකර** ගුරු කොට ගත් ආකාරය යි." මේ පිළිබඳ ඔබේ අදහස දක්වන්න.

3. රසවාදයෙහි අන්තර්ගත මූලිකාංග, සිංහල පද්‍ය සාහිත්‍යය ඇසුරෙන් ගත් නිදසුන් මගින් විවරණය කරන්න.

4. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකකට** කෙටි සටහන් සපයන්න.

   i. ඖචිත්‍යය    ii. ශබ්දලංකාර
   iii. අතිශයෝක්තිය    iv. උපමාලංකාරය
   v. ගෞඩී රීතිය

## III කොටස

5. "කිනම් වර්ණනාවක් වුව ද වාග්චිත්‍ර මැවෙන සේ පාඨකයා හමුවෙහි නිරූපණය කිරීමට කව්සිළුමිණි කවියා දක්වන සාමර්ථ්‍යය විස්මයජනක ය" මේ අදහස සනිදර්ශන ව විමසන්න.

6. "ශබ්දර්ථෞ සහිතෞ කාව්‍යම්" යන ප්‍රකාශය **මයූර සන්දේශය** සම්බන්ධ ව යෙදීමේ යුක්තියුක්ත භාවය නිදසුන් සහිතව පෙන්වා දෙන්න.

7. තත්කාලීන සමාජයෙහි ඇති වූ හින්දු දේව සංකල්පය නමැති අභියෝගයට නිසි පිළිතුරක් දීමට බුදුගුණාලංකාර කතුවරයා සමත් වූ ආකාරය සාකච්ඡා කරන්න.

8. "සොබාදහම රමණීය ලෙස වර්ණනා කළෝ සන්දේශ කවියෝ ය" මෙම අදහසෙහි සත්‍යාසත්‍යතාව, සම්භාව්‍ය සන්දේශ කාව්‍ය **තුනක්වත්** ඇසුරින් පෙන්වා දෙන්න.

(2 සිට 8 දක්වා පිළිතුරුවලට උපරිමය ලකුණු 20 බැගිනි.)